# National Media Foundation of Sri Lanka

NMFSL

Regional Head Office: No. 90, Jawatta Road, Colombo - 05, Sri Lanka
E-mail: harshdgtower@gmail.com | cimrpd.mediaresearchasia@gmail.com
Tel: 0094 - 77 7076830 / 0094 - 77 7189076

**මාධ්‍ය නිවේදනයයි**

## නිශ්චිත වයස් මට්ටමක් දක්වා පාසල් දරුවන්හට සමාජ මාධ්‍ය භාවිතය තහනම් කරන ලෙස රජයට කරනු ලබන ඉල්ලීම

ලෝකය තුළ සිදුවන වේගවත් සන්නිවේදන හා තාක්ෂණ දියුණුවත් සමග බෝහෝ රටවල් එහි අනිටු ප්‍රතිඵල ද සොයා බලා ඒ පිළිබද කටයුතු කිරීම පිළිගත් මූලධර්මයකි.

ලෝකයේ සෑම රටක්ම එක හා සමාන සමාජ ආර්ථික හා ආගමික සංස්කෘතික ක්‍රියාවලියක් නොමැත. එසේම දේශපාලනිකව හෝ වෙනත් නීතිමය තත්වයන් යටතේ වුවද එම රටේ අනන්‍යතාවයන් ආරක්ෂා කර ගැනීමට පුළුල් වෙහෙසක් දරනු ලබයි.

අප සංවිධානය වසර 30 කට අධික කාලයක් පාසල් මාධ්‍ය සමාජ තුළ මෙන්ම ප්‍රධාන ධාරාවේ නිවැරදි මාධ්‍ය සංස්කෘතියක් , විධිමත් මාධ්‍ය අධ්‍යාපනයක්, මාධ්‍ය වෘත්තිමයභාවය මෙන්ම සන්නිවේදන සාක්ෂරතාව ප්‍රවර්ධනය සදහා කැප වූ ස්වෙච්ඡා සංවිධානයක් වන අතර මාධ්‍ය ආයතන ගණනාවක ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදීන් ආචාර්ය මහාචාර්යවරුන්ගෙන් සමන්විත ආයතනික ව්‍යුහයකි.

දිවයිනේ ප්‍රමුඛ පෙළේ පාසලක සිදුවූ බව කියන ආන්දෝලනාත්මක සිදුවීමක් හේතුවෙන් මේ වන විට සමාජ මාධ්‍ය තුළ දැඩි කතාබහක් නිර්මාණය වී තිබේ. තාක්ෂණය අවභාවිත කරමින් පටිගත කරන ලද අසභ්‍ය දර්ශන සමාජගත වීම හරහා අදාළ පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වයට මෙන්ම ආයතනයේ කීර්තිනාමයට ද විශාල හානියක් සිදුව ඇත .මෙවැනි සිදුවීම් නිසා අපගේ මානව සදාචාරාත්මක සීමාවන් බිඳවැටීම සහ තාක්ෂණය අවභාවිතය පිළිබඳව බරපතල සමාජීය අවධානයක් යොමු කරවා ඇත.

ශ්‍රී ලංකාවේ පවතින නීතිමය රාමුවට අනුව, විශේෂයෙන්ම වයස අවුරුදු 18ට අඩු ළමයින් සම්බන්ධ අසභ්‍ය දර්ශන නිර්මාණය කිරීම, බෙදා හැරීම හෝ හුදෙක් තම සන්තකයේ තබා ගැනීම පවා බරපතල අපරාධයක් ලෙස සලකා දණ්ඩ නීති සංග්‍රහය සහ අසභ්‍ය ප්‍රකාශන ආඥා පනත යටතේ මෙවැනි වැරදි සඳහා දැඩි දඬුවම් නියම කල යුතු අතර, ළමයින් යොදා ගනිමින් සිදුකරන අසභ්‍ය ක්‍රියා හෝ දර්ශන ළඟ තබා ගන්නා පුද්ගලයින්ට එරෙහිව නීතිය තදින් ක්‍රියාත්මක විය යුතුය. වැඩිහිටියන් සම්බන්ධ අසභ්‍ය දර්ශන බෙදා හැරීම හෝ වාණිජ අරමුණු සඳහා භාවිතා කිරීම ද දඬුවම් ලැබිය හැකි වරදක් ලෙස පෙන්වා දිය යුතුය. මෙවැනි අන්තර්ගතයන් සමාජ මාධ්‍ය ඔස්සේ හුවමාරු කිරීමෙන් හෝ ළඟ තබා ගැනීමෙන් වැළකී සිටීමේ වැදගත්කම අවධාරණය කලයුතුය.

සභාපති
ජාතික මාධ්‍ය පදනම

ප්‍රධාන ලේකම්
ජාතික මාධ්‍ය පදනම.

2026 ජනවාරි 27

Academic Council

Prof. Dharmakeerthi Sri Ranjan (Sri Lanka)
prof Kamal Waleboda (Sri Lanka)
Dr. Harsha B. Abeykoon (Sri Lanka) - Chief Academic Coordinator
Prof. Tuder Weerasinghe (Sri Lanka)
Dr. Nayana Suraweera (Sri Lanka)